රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 185

මගේ අංකය: 543 ඊ 675 සී.
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1981 ජනවාරි මස 08 දින,

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
රාජ්‍ය සංස්ථා ප්‍රධානීන් වෙත.

## ගිනි අනතුරු වැළැක්වීමට ප්‍රමාණවත් ආරක්ෂා විධිවිධාන ඇතිකිරීම.

රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය සංස්ථා ගබඩා ගින්නෙන් ආරක්ෂා කිරීම පිළිබඳව වූ 1980.02.25 වන දින අංක.160 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කරුණාකර බලන්න.

02. රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය සංස්ථා

(අ) රජයේ දේපල විනාශවීමට හේතුවිය හැකි ගිනි ගැනීමේ අනතුරුදායක තත්ත්වය අඩුකිරීමට සහ

(ආ) ගින්නක් ඇතිවූ විටක, ඉන් වන හානිය හැකිතරම් අඩුකර ගැනීමේ අදහසින් ප්‍රමාණවත් සූදානම් මට්ටමක් පවත්වාගෙන යාම

සඳහා පියවර ගැනීම අත්‍යවශ්‍ය වේ.

03. එමනිසා කරුණාකර 2 (අ) සහ 2 (ආ) ඡේදවල සඳහන් සියළුම කාර්යයන් භාරව කටයුතු කිරීම ඔබ අමාත්‍යාංශයෙහි/දෙපාර්තමේන්තුවෙහි/රාජ්‍ය සංස්ථාවෙහි වගකිව යුතු නිලධාරියෙකු වෙත පැවරීමට කටයුතු කරන්න.

04. මෙම නිලධාරියා පහත දැක්වෙන කරුණු පිළිබඳව වග බලාගත යුතු ය. ඒ ඒ කාර්යාල ගබඩා හෝ ගුදම් සඳහා හදිසියකදී භාවිතය සඳහා යෝග්‍ය සැලසුමක් ඇතිකිරීම සහ එම සැලසුම හදිසි අවස්ථාවකදී සහාය අවශ්‍ය වන සියළුම නිලධාරීන්ට හා ආයතනවලට ලබා දීම මෙම නිලධාරියාගේ වගකීම වේ. මෙම සැලැස්මට පහත දැක්වෙන කරුණු අඩංගු විය යුතු ය.

(අ) ගබඩා, ලේඛනාගාර ආදී ගිනි අනතුරු බහුල ස්ථානවල, පිහිටීම.

(ආ) ගිනි නිවන "හෝස්", ගිනි නිවන උපකරණ සහ දුරකථන, ගිනි අනතුරු හැඟවීමේ සහ අනතුරු සංඥා, ඝට ආදී සංදේශන උපකරණ පිහිටා ඇති ස්ථාන.

(ඇ) අදාල ආයතනවල නම් සහ දුරකථන අංක ආදිය -

උදාහරණ: (I) ආසන්න පොලිස් ස්ථානය;
(II) ආසන්න ගිනි නිවන ඒකකය;
(III) ගොඩනැගිලි කඩා දැමීමට අවශ්‍ය බර යන්ත්‍රෝපකරණ ලබාගත හැකි ආසන්න වැඩපොල;
(IV) ගින්න නිවීමට වතුර ලබාගත හැකි ආසන්න ස්ථානය.

2 පිටුවට...

05. ඒ ඒ ස්ථානයෙහි සියලුම සේවකයන්ට, ගිනි නිවීමේ උපකරණ භාවිතය ඇතුළුව ගින්නක් ඇතිවූ අවස්ථාවක ගත යුතු පියවර ගැන උපදෙස් සහ නිපුණත්වයක් ලබාදිය යුතු ය.

06. ස්ථානයක සේවකයන් වරින් වර වෙනස්වීමට ඉඩ ඇති හෙයින් ඔවුන්ට, හදිසි අවස්ථාවකදී ගතයුතු පියවර පිළිබඳ නිපුණත්වයක් ලබාදීම සඳහා නියමිත කාලසීමාවන් තුළ පෙරහුරුවීම් පැවැත්වීමට වගබලා ගතයුතු යි.

07. සියළුම බඩු ගොඩ, බඩු නිකුත්කිරීම්, ලැබීම් පිළිබඳ වාර්තා පොත් වැනි වැදගත් ලියකියවිලිවලට ගින්නෙන් සිදුවන හානිය හැකිතාක් අඩුකරගැනීම සඳහා ඒවා ආරක්ෂා සහිත ස්ථානයන්හි තැබිය යුතු ය.

08. පහසුවෙන් ඇවිලෙන බඩු ගබඩාකිරීමේදී ගිනි නිවීමට විශාලම ස්ථානවලට පහසුවෙන් ළඟාවිය හැකි පරිදි ද්‍රව්‍ය ගබඩා කළයුතුය.

09. ඉන්ධන හා වෙනත් ගිනි ගන්නා සුළු ද්‍රව්‍ය ගබඩා කිරීමේදී යෝග්‍ය ආරක්ෂක විධිවිධාන සැලසිය යුතුය. එවැනි සෑම ස්ථානයකට "දුම්බීම තහනම්" යන දැන්වීම ප්‍රදර්ශනය කළ යුතු ය.

10. නව ගොඩනැගිලි සඳහා සැලසුම් කිරීමේදී ගිනි අනතුරුවලින් ආරක්ෂාව ඇතිකිරීමට අවශ්‍ය ප්‍රමාණවත් සියළුම විධිවිධාන, සැලසුම්වල අඩංගු කිරීමට ක්‍රියා [illegible]සිය යුතු ය.

11. හැම අවස්ථාවලදී ගිනි සමීක්ෂණ, පරීක්ෂා කිරීම්, සේවකයන් ගිනි නිවීමේ කටයුතුවල පුහුණු කිරීම ආදිය සම්බන්ධයෙන් තවදුරටත් තාක්ෂණික උපදෙස් ලබාගැනීම සඳහා කොළඹ 10, ඩාලි පාරේ පිහිටි කොළඹ මහ නගර සභාවේ ගිනිනිවීම් සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිලධාරියාගේ හෝ මහනුවර මහ නගර සභාවේ ගිනි නිවන සමුදා නිලධාරියාගේ උපදෙස් ලබාගත යුතු ය.

12. 1980 මැයි 21 දින දරණ පහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණය ද ඔබේ අවධානය යොමුකරවමි.

> "රජයේ වාණිජ ආයතන සහ කර්මාන්ත කටයුතු සම්බන්ධයෙන් රක්ෂණ ආවරණය ලබාදීම පිණිස රජයේ රක්ෂණ අරමුදල ගැන සලකා ඇති බව සැලකිල්ලට ගන්නා ලදී."

Siriwardhana

ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.